# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/24 - 2017 ඔක්තෝබර් මස 04 වැනි බදාදා - 2017.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2017 අංක 04 දරන මධ්‍යම පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරියක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍යාංශයේ ලේකම් පී. බී. විජයරත්න වන මම, මෙහි පළ කරන ලද මධ්‍යම පළාත් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරියක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත මෙම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත් වී මෙන් පසු මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

පී. බී. විජයරත්න,<br>
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය<br>
සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල,<br>
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක කටයුතු,<br>
සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ,<br>
ආහාර සැපයුම් හා බෙදාහැරීම් කටයුතු සහ ආයෝජන<br>
සම්බන්ධිකරණ වෙනත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන<br>
විෂයයන් භාර අමාත්‍යාංශයේ ලේකම්.

2017 සැප්තැම්බර් මස 22 වැනි දින,<br>
පල්ලේකැලේ,<br>
මධ්‍යම පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 3713 — 09 (2017/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය
සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස්බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක කටයුතු,
සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ,
ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන
සම්බන්ධීකරණ පිළිබඳ අමාත්‍යාංශය

මධ්‍යම පළාත

**2017 අංක 04 දරන මධ්‍යම පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ප්‍රඥප්තිය**

මධ්‍යම පළාත

**2017 අංක 04 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ප්‍රඥප්තිය**

මධ්‍යම පළාත තුළ පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින් මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන විසින් එකතු කරනු ලබන අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන්කර තැබීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම, සකස් කිරීම හා අපහරණය විධිමත් කිරීම සහ නියාමනය හා අධීක්ෂණය කිරීම පිණිස මධ්‍යම පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් පිහිටුවීම සඳහා ද, පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සියලු පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා සහ ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

01. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 2017 අංක 04 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන (මෙහි මින් මතු ''නියමිත දිනය'' වශයෙන් සඳහන් කරනු ලබන) දිනයකදී ක්‍රියාත්මක වන්නේ ය.

**1 වන කොටස**

***මධ්‍යම පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සංස්ථාපනය කිරීම***

02. (I) මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන මධ්‍යම පළාතේ පරිසර අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

(II) අධිකාරිය (1) වන උපවගන්තියෙන් ඊට වෙන් කරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. අධිකාරියේ නාමයෙන් එය විසින්ද එයට එරෙහිවද නඩු පවරනු ලැබිය හැකිය.

අධිකාරියේ සාමාජිකයින්

03. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය.

(I) නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් සය දෙනෙකුගෙන් එනම්,

(අ) මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජ්‍ය ලේකම්වරයෙක්
(ආ) මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන නිලධාරියෙක්,
(ඇ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා
(ඈ) මධ්‍යම පළාතේ නියෝජ්‍ය ලේකම් (මුදල්)
(ඉ) මධ්‍යම පළතේ පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරන නියෝජිතයෙක්
(ඊ) මධ්‍යම පළාත් සභාවේ නීති නිලධාරී සහ ;

(II) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන

(අ) අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් දෙදෙනෙක්ගෙන් හා
(ආ) මධ්‍යම පළාතේ සියළුම මහ නගර සභා, නියෝජනය කිරීම සඳහා එක් නගරාධිපති වරයෙක් සියලුම නගර සභා නියෝජනය කිරීම සඳහා එක් නගර සභා සභාපතිවරයෙක් හා සියළුම ප්‍රාදේශීය සභා නියෝජනය කිරීම සඳහා එක් ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුගෙන්ද සමන්විත වන්නේ ය.

(III) අධිකාරියේ සිය සාමාජිකයින් අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත් කරනු ලැබිය යුතු වන්නේ ය. එවැනි සියලු පත්වීම් රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

(IV) ඉහත (II) උප වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයින් අපද්‍රව්‍ය කළමනාකරණ කාර්යයන්ට අදාළ කවර හෝ සමාගමක කොටස් හිමි අයෙකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හෝ උපදේශකයෙකු නොවිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ඉහතින් පත්කළ සාමාජිකයින් අතරින් එක් සාමාජිකයෙකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය. අධිකාරියේ සභාපතිවරයා

(3) සභාපතිවරයාගේ ධූර කාලය ඔහු අධිකාරියේ සාමාජිකත්වය දරන කාල සීමාව හා අමාත්‍යවරයාගේ ප්‍රසාදය ඇති තාක් කල් විය යුතු ය.

(4) (I) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් අශක්නුතාවයක් නිසා සභාපතිවරයාට තම ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වශයෙන් වැඩ බැලීම සඳහා සිටින සාමාජිකයින් අතරින් කෙනෙකු පත් කරනු ලැබිය හැකි ය. සභාපතිවරයාගේ ධූරය අවසන් වීම

(II) සභාපතිවරයාගේ ධූරය පහත දැක්වෙන හේතු එකක් හෝ කීපයක් නිසා අවසන් විය යුතු ය.

(අ) 4 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සාමාජිකත්වය සඳහා නුසුදුස්සකු වීම
(ආ) තම අත්සන යටතේ අමාත්‍යවරයාට යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම
(ඇ) අමාත්‍යවරයා විසින් හේතු දක්වා ඉවත් කිරීම
(ඈ) මිය යාම

04. යම් තැනැත්තෙකු,

(1) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු නම්
(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම්
(3) පිළිගත් වෛද්‍ය මණ්ඩලයකින් සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ පූර්ණ අකර්මණ්‍යතාවයකට පත්ව ඇත්නම්
(4) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ බුන්වත්භාවයට පත් තැනැත්තෙකු වශයෙන් ප්‍රකාශ කරනු ලැබ, එම බුන්වත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු නම්
(5) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් අපරාධමය දණ්ඩණයකට යටත් කරනු ලැබ සිටියේ නම් හෝ එවැනි දණ්ඩනයක් විඳිමින් සිටින්නේ නම්
(6) අල්ලස් සම්බන්ධ වරදකට චෝදනා ලැබසිටින්නෙකු හෝ වරදකරුවකු නම්

එම තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම ක්‍රියා කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

05. අධිකාරිය රැස්වනු ලබන සෑම දිනයක් සඳහාම එක් එක් රැස්වීමකට සහභාගී වූ සෑම සාමාජිකයෙකුටම අමාත්‍යවරයා විසින් කළින් කළ තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය. අධිකාරියේ රැස්වීම්වලට පැමිණීම

(1) අධිකාරියේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය. අධිකාරියේ මුද්‍රාව
(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.
(3) අධිකාරියෙහි සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී, හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන තැබිය යුතු ය.

07. (1) අධිකාරියේ සෑම රැස්වීමකදීම සභාපතිවරයා මුලසුන දැරියයුතුය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවකදී පැමිණසිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් බහුතරයේ එකඟතාවය මත යම් තැනැත්තකු එම රැස්වීම සඳහා පමණක් සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය. අධිකාරියේ රැස්වීම්

(2) අධිකාරියේ යම් රැස්වීමක ගණපූර්ණය හත් දෙනෙකු විය යුතු ය.

(3) අධිකාරිය විසින් සළකා බැලීම සඳහා ඉදිරිපත් වන සෑම කරුණක්ම අධිකාරියේ රැස්වීමකදී තීරණය කළ යුතු අතර, එම කරුණු රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් බහුතරයක් විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(4) එවැනි රැස්වීමකදී සලකා බලනු ලබන යම් කරුණක් පිළිබඳව තබන ඡන්දවල සමානත්වයක් ඇති වුවහොත් සභාපතිවරයාට තම මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(5) අධිකාරියේ රැස්වීමකදී යම් සාමාජිකයකු තෝරා පත් කර ගැනීමෙහි ලා හෝ පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබුණ බවට හෝ එවැනි සාමාජිකයකු නුසුදුස්සකු වූ බවට පසුව සොයා ගනු ලැබුවහොත් එම තැන්තිතාට සුදුසුකම් තිබූ ලෙස සලකා එතෙක් පැවැත්වුණු රැස්වීම් වලදී කරන ලද සියලු ක්‍රියා වලංගු විය යුතු ය.

(6) අධිකාරියේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් රැස්වීමකදී ගනු ලැබූ කිසිම තීරණයක්, කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

නිල බලයෙන් පත්කළ සාමාජිකයින්ගේ ධුර කාලය

08. අධිකාරියට නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයෙක්ම තමා අධිකාරියට පත්කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරවද එම ධුරය දරන තාක් කල් නිල බලයෙන් පත්වූ අධිකාරියේ සාමාජිකයකු ලෙස ධුරය දැරිය යුතු ය.

## II වන කොටස

### *අධිකාරියේ අරමුණු බලතල හා කර්තව්‍ය*

09. අධිකාරියෙහි අරමුණු පහත දැක්වෙන පරිදි වේ.

අධිකාරියේ අරමුණු

(1) මධ්‍යම පළාතේ පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින් පළාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවලින් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය උපරිම ලෙස වළකා, පළාතේ මහජනයාගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද යහපත සඳහා පරිසරය පිරිසිදුව තබා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම.

(2) අපද්‍රව්‍ය මගින් සිදුවිය හැකි ආපදාවන් අවම කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශ තුළ ජනනය වන අපද්‍රව්‍ය පරිසරයට හා සෞඛ්‍යයට හානිකර නොවන අන්දමින් බැහැර කිරීම, ගබඩා කිරීමේ කාර්ය විධිමත් කිරීම සඳහා සැලසුම් කිරීම, උපදෙස් දීම, සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම, පළාත් පාලන ආයතන හා ඊට අදාළ අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය හා අපද්‍රව්‍ය මගින් සිදුවිය හැකි ආපදාවන් නිශ්චය කිරීම, තක්සේරු කිරීම,

(3) අපද්‍රව්‍ය නැවත පාවිච්චි කිරීම හා ප්‍රතිචක්‍රීයකරණය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම.

(4) අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස බැහැර කිරීම නිසා දූෂණය වී ඇති ස්ථාන, ප්‍රදේශ හා කලාප යථා තත්ත්වයට පත් කිරීම සඳහා සැලසුම් කිරීම හා සැලසුම් ක්‍රියාත්මක කිරීම.

10. අධිකාරියේ බලතල පහත පරිදි වන්නේ ය.

අධිකාරියේ බලතල හා කාර්යයන්

(1) පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාතේ පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණය කිරීම සහ ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(2) පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(3) අපද්‍රව්‍ය ජනනය වීම, සංයුතිය තීරණය කිරීම, වර්ග කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, සැකසීම, බැහැර කිරීම අපද්‍රව්‍ය ජනනය කිරීම අවම කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, දත්ත එක් රැස් කිරීම හා වාර්තා ලබා ගැනීම.

(4) අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු අයකර ගැනීම.

(5) පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු පොදු ක්‍රමවේදයන් නියම කිරීම ඒවා ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(6) අධිකාරියේ බලතල හා කර්තව්‍යයන් නිවැරදිව ඉෂ්ට කිරීම හා ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය ගිවිසුම් වලට එළඹීම.

(7) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්පත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුළියටදීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(8) තත්කාලයේ බලපැවැත්වෙන නීති රීතීන්ට අනුකූලව අධිකාරියේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම, බඳවා ගැනීමේ පටිපාටිය හා විනය පටිපාටි සකස් කිරීම.

(9) අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව පවතින නීති රීතීන්ට අනුකූලව විදේශ තාක්ෂණය, විදේශ ආධාර ලබාගැනීම.

(10) අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ නීති හා රෙගුලාසි උල්ලංඝණය කිරීම පිළිබඳව මහජනයා, පළාත් පාලන ආයතන හෝ වෙනත් ඕනෑම ආයතනයක් මගින් කෙරෙන පැමිණිලි පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධ සුදුසු පියවර ගැනීම.

(11) අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව මහජනයා සහ පළාත් පාලන ආයතන දැනුවත් කිරීම.

(12) පවත්නා නීතියට යටත්ව පරිසරය ආරක්ෂා කිරීම.

(13) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා රජයේ පවත්නා නීති රීති රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය කාර්ය මණ්ඩලය හා එහි සංයුතිය තීරණය කිරීම.

## III වන කොටස

### *අධිකාරියේ කාර්ය මණ්ඩලය*

11. අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම සහ එම කාර්ය මණ්ඩලයට අදාළව තත් කාලයේ බල පැවැත්වෙන නීති රීති රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව මතු දැක්වෙන කාර්යයන් කිරීමට අධිකාරියට බලය ඇත. කාර්ය මණ්ඩලය

12. (1) අධිකාරියේ අනුමැතිය ඇතිව විෂයභාර ඇමතිවරයාගේ එකඟතාවය සහිතව අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති අයෙකු සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය. සාමාන්‍යාධිකාරිවරයා

(2) සාමාන්‍යාධිකාරිවරයා අධිකාරියේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ ය. බඳවා ගැනීමේ පටිපාටිය යටතේ පැවරෙන කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේ ය.

(3) සභාපතිවරයා විසින් අධිකාරියේ අභිවෘද්ධිය සඳහා කලින් කළ අවශ්‍ය යැයි සැලකෙන වෙනත් බලතල හා කාර්යයන් සාමාන්‍යාධිකාරිවරයා වෙත පවරා දෙනු ලැබිය හැකිය.

13. ඉහත 11 වගන්තිය යටතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව

(1) මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව සියලු පත් කිරීම්, උසස් කිරීම්, කාර්ය මණ්ඩලයට අදාළ වන අධ්‍යාපනික, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් සහ වේතන හා වැටුප් ප්‍රමාණයන්ද ඇතුළුව බඳවා ගැනීමේ පටිපාටිය සැකසීම හා අදාළ ආයතන වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

(2) විනය දඬුවම් හා සේවය අවසන් කිරීම සහ අහෝසි කිරීම ද ඇතුලු විනය පාලනය, සාමාන්‍ය හැසිරීම, නිවාඩු යනාදී පිරිස් පාලනයට අදාළ නියමයන් පැනවීම.

(3) කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රම ඇති කිරීම.

(4) අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා අර්ථ සාධක අරමුදල් ක්‍රම ක්‍රියාත්මක කිරීම, පාරිතෝෂික දීමනා ගෙවීම සහ අධිකාරිය තීරණය කරන පරිදි විශේෂ දීමනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(5) අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා සුභ සාධන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට ඃ

අධිකාරියට බලය ඇත.

14. (1) ඉහත II වගන්තිය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව සේවකයින් බඳවා ගැනීමට අධිකාරියට බලය ඇත.

15. (1) අධිකාරියේ විධිවිධානයන්ට යටත්ව අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා නිලධාරින් යෙදවීම, මෙහෙයවීම, අධීක්ෂණය, පාලනය කිරීම හා විනය කටයුතු පවත්වා ගෙන යාම. සාමාන්‍යාධිකාරිවරයාගේ බලතල

(2) අනාගත අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ නව ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ මෙම ප්‍රඥප්තියේ අරමුණු වඩාත් ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා ඉවහල් වන සංවර්ධන සහ නව නිර්මාණාත්මක ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමත්, ජාතික ප්‍රතිපත්තින්ට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමත් ඒ සඳහා අදාළ නීති පිළිවෙත් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

(3) අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා පාර්ශ්වයන් සමග ගිවිසුම්වලට එළඹීමත්, අධිකාරිය හා සම්බන්ධ ගිවිසුම් කටයුතු පවත්වාගෙන යාම හා පාලනය ඇතුළුව වත්කම් ආරක්ෂා කිරීම.

සාමාන්‍යාධිකාරිවරයා විසින් බලය පැවරීම

16. සාමාන්‍යාධිකාරිවරයාගේ බලතල හා කර්තව්‍යයන් අතුරින් ඔහු අවශ්‍ය යැයි සලකන පරිදි යම් කිසිවක් වෙනත් සුදුසු මාණ්ඩලික නිලධාරින් වෙත ලිඛිතව පැවරීම.

## IV වන කොටස

### *මුදල්*

අධිකාරියේ ගිණුම

17. (1) අධිකාරියට ඊටම අයත් ගිණුමක් තිබිය යුතු ය.

අධිකාරියේ ගිණුමට මුදල් ලැබීම

(2) පහත දක්වෙන මුදල් අධිකාරියේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(I) අධිකාරිය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම මගින් ලබන හෝ අය කරනු ලබන සියලු මුදල්

(II) පළාත් සභාව හෝ මධ්‍යම රජය විසින් වෙන් කර දෙනු ලබන සියලු මුදල්

(III) දේශීය හා විදේශීය ආධාර, පරිත්‍යාග ප්‍රදාන හා ණය වශයෙන් අධිකාරියට ලැබෙන මුදල්

(IV) පළාත් අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ගාස්තු වශයෙන් අධිකාරියට ලැබෙන මුදල් හෝ ගාස්තු වශයෙන් අය කරනු ලබන සියලු මුදල්

(V) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන අවස්ථාවල දී අධිකාරිය විසින් පවරනු ලබන නීති කෘත්‍යන් හි දී අයකරන දඩ මුදල් සහ නඩු ගාස්තු

(VI) ගිණුම පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රඥප්තියේ පළාත් විධිවිධානවලට හා පළාත් අරමුදල සම්බන්ධයෙන් වන 1987 අංක 42 දරන සභා පනතේ අදාළ විධිවිධානවලට යටත්ව සිදුවිය යුතු ය.

ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය

18. අධිකාරියේ ගිණුමට ලැබෙන මුදල් සහ ගෙවීම් පිළිබඳව සාමාන්‍ය අධීක්ෂණය සහ පරිපාලනය සම්බන්ධ වගකීම් සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේ ය.

අධිකාරිය විසින් අරමුදල් උපයෝගී කර ගැනීම

19. අධිකාරියේ ගිණුම පහත සඳහන් පරිදි මුදල් වැය කළ හැකි වන්නේ ය.

(1) අධිකාරියේ සාමාජිකයින්ගේ දීමනා

(2) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය සතු සියලු බලතල කාර්යයන් හා වගකීම් ඉටු කිරීමේදී වැය කිරීමට සිදුවන සියලුම මුදල්

(3) අධිකාරියේ නිලධාරීන්, සේවකයින්ගේ වේතන ගෙවීම් පාරිශ්‍රමික දීමනා සහ අනෙකුත් එවැනි සියලු ගෙවීම්

(4) අධිකාරියේ කටයුතු හා කාර්යයන් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සියලුම මුදල්

අධිකාරිය විසින් ණය ගැනීම

20. (1) අධිකාරියේ නිශ්චිත පරමාර්ථ සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය මත ණය ලබා ගැනීමට අධිකාරියට බලය ඇති අතර ණය මුදල් ප්‍රමාණය ආපසු ගෙවීමේ කාල සීමාවල ණය පාලනය යන කොන්දේසි සහ ණය ලබා ගැනීමට අපේක්ෂිත ආයතන පළාත් අමාත්‍ය මණ්ඩලය තීරණය කරන පරිදි විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියට සිය වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වනු ලබන කෙටිකාලීන මුදල් අවශ්‍යතා අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුවද, අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුදල කිසිම අවස්ථාවකදී මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල් ප්‍රමාණයන් නොඉක්මවිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය

21. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

22. (1) අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සියලු මූල්‍යමය ගණුදෙනු හා සම්බන්ධයෙන් රජයේ විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කළ විගණනය කරනු ලැබිය හැකිය. මධ්‍යම පළාතේ විගණන අධ්‍යක්ෂවරයාටද අවශ්‍ය වූ විට විගණනය කළ හැකිය. අධිකාරියේ ගිණුම් විගණනය

(2) එක් එක් මුදල් වර්ෂය සඳහා ගිණුමේ වත්කම් හා බැරකම් එම මුදල් වර්ෂය අවසන්ව මාස තුනක් ඉකුත් වීමට පෙර විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණනයේදී ඔහුට සහාය වීමේ කාර්යය සඳහා සුදුසුකම් ලත් යම් විගණකයෙකු හෝ විගණකයින්ගේ සේවාව ලබාගත හැකි අතර, ඔවුන් ඔහුගේ උපදෙස් හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකාධිපති විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා සභාපති/සාමාන්‍යාධිකාරි විසින් තීරණය කරනු ලබන හෝ විගණන අංශය මගින් ඉල්ලීම් කරනු ලබන යම් මුදලක් විගණකාධිපති වෙත අධිකාරියේ අරමුදල් වලින් ගෙවිය යුතුවේ. අධිකාරියෙන් විගණකාධිපතිවරයාට ලැබෙන යම් මුදලක් සේවයේ යොදවා ගත් යම් සුදුසුකම් ලත් විගණකයෙකු වෙත කළ ගෙවීම අඩු කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

(4) විගණකාධිපතිවරයාට සහ ගිණුම් විගණනය කිරීමේදී ඔහුට සහාය වන යම් පුද්ගලයකුට විගණකාධිපතිවරයාට විගණන කාර්යයේදී අවශ්‍ය යැයි සලකන සියලු පොත් පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ ගිණුමට සම්බන්ධතාවයක් ඇති අනිකුත් ලියවිලි පරීක්ෂා කිරීමේ අවසරය තිබිය යුතු අතර එම කාර්ය සඳහා අවශ්‍ය යයි තමන්ගේ දැනුම අනුව සැපයිය හැකි තොරතුරු අධිකාරිය හෝ එහි නිළධාරීන් විසින් ඔවුනට සැපයිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යයන් සඳහා සුදුසුකම් ලත් විගණක, යනු

I. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නැතහොත් නීතියෙන් පිළිගෙන ඇති කිසියම් ආයතනයක සාමාජිකයෙකු වන එම ආයතනය පාලක සභාව විසින් ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා නිකුත් කර ඇති සහතිකයක් ලබාගෙන ඇති පුද්ගලයින්

II. එක් එක් වාසික හවුල්කරුවාට ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් සමග

III. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකත්වය දරන හවුල්කරුවන්ගෙන් සමන්විත ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

23. (1) විගණකාධිපතිවරයා අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට

(I) ඔහුට අවශ්‍යවූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණු හෝ නොලැබුණු බව සඳහන් කරමින්

(II) අධිකාරියේ කටයුතු සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මැනවින් පිළියෙල කර තිබේද යන්න සඳහන් කරමින්

(III) ඔහුගේ මතය අනුව පළාත් සභාව විසින් අධිකාරියේ ගිණුම් හා කටයුතු පිළිබඳව කිසියම් පරීක්ෂණයක් කිරීම සඳහා උනන්දුවක් දැක්විය යුතු යැයි අදහස් කරන ගිණුම්වලට අදාළ කිසියම් කරුණක් වේනම්, ඒ ගැන අවධානය යොමු කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ හැකිය.

(IV) විගණකාධිපතිවරයා සිය වාර්තාව විගණනය කරන ලද ගිණුම් සමග සභාපතිවරයාට යවනු ලැබිය යුතු ය.

24. එක් එක් වර්ෂයේදී ගිණුමේ වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කළ ගිණුම විගණකාධිපති වාර්තාව තමා වෙත ලැබීමෙන් පසුව, සභාපතිවරයා විසින් එම වාර්තාවද, වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කළ ගිණුම් ද අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශය සමග පළාත් පාලන විෂය භාරව සිටින අමාත්‍යවරයා වෙත භාර කළ යුතු වන අතර, ඔහු විසින් ඒවායේ පිටපත් ඒවා අදාළ ගිණුමේ මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු වන්නේ ය. ගිණුම් වාර්තා වාර්ෂිකව වාර්තා කිරීම

## V වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

රීති සෑදීමේ බලය

25. (1) අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සඳහා නියෝග සෑදිය හැකි වන්නේ ය.

(2) 1 වන උප වගන්තිය යටතේ පිරිනමනු ලබන බලතලවල පොදු භාවයට අගතියක් නොවන පරිදි පහත සඳහන් සියලු හෝ එක් එක් කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය.

ප්‍රඥප්තිය යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

(3) 1 වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකාරිය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරණ ලද වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

26. අධිකාරියට එරෙහි වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි සිවිල් හෝ අපරාධ නඩුවකින් අධිකාරිය විසින් අයකර ගනු ලබන යම් වියදමක් හෝ වන්දියක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. අදාළ වරද සම්බන්ධයෙන් නිලධාරියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටී නම් අදාළ මුදල අධිකාරියේ අරමුදලින් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වන්නේ ය.

අධිකාරියේ සාමාජිකයන්, සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් බව

27. (1) අධිකාරියේ යම් සාමාජිකයෙකු හෝ අධිකාරියේ යම් සේවා නියුක්තිකයෙකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයෙකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### *අර්ථ නිරූපණය*

අර්ථ නිරූපනය

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ

''පළාත'' යන්නෙන් මධ්‍යම පළාතද,
''පළාත් සභාව'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවද,
''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා ද,
''අමාත්‍යවරයා'' යන්නෙන්, මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා ද,
''අමාත්‍යාංශය'' යන්නෙන්, මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශය ද,
''පළාත් සභාව'' යන්නෙන් මධ්‍යම පළාත් සභාවද,
''අමාත්‍යාංශයේ ලේකම්'' යන්නෙන්, මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ලේකම් ද,
''පළාත් පාලන ආයතන'' යන්නෙන්, මධ්‍යම පළාත තුළ ඇති මහ නගර සභා, නගර සභා, හෝ ප්‍රාදේශීය සභා ද,
''පුද්ගලයා'' යන්නට, පොදු සංස්ථාවක්, සමාගමක්, රජයට අනුබද්ධ ආයතනයක් ද,
''දූෂණය'' යන්නෙන් පරිසරයට වැඩදායී ලෙස උපයෝගී කර ගැනීමට අහිතකර ලෙස හෝ මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුභසාධනයට නැතහොත් සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ජලජ ජීවනයට හෝ සෑම වර්ගයකම ශාක වල උපද්‍රවකාරී හෝ උපද්‍රවකාරී තත්ත්වයක් ඇති විය හැකි වන ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ, පිටකිරීමේ හෝ බහා තැබීමෙන් පරිසරයේ යම් කොටසක භෞතික, තාපජ, රසායනික, ජෛවී හෝ විකිරණශීලී පදාර්ථයන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් වෙනස් කිරීම ද,
''අපද්‍රව්‍ය'' යන්නෙන්, මිනිසාගේ පැවැත්මට හා සෞඛ්‍යයට හිරිහැර, තර්ජන හා කරදර ගෙන දෙන හෝ කාලයක් සමග එසේ වීමට ඉඩ ඇති, ඉවතලන දෑ ප්‍රමාණයෙන් විශාල වූ ඉවතලන දෑ. අළු, ගොහොරු, මඩ, ඉවතලන තෙල්, සත්ත්ව සහ මිනිස් මළපහ, ඉවතලන ආම්ලික හා භාෂ්මික දෑ, සත්ව මළකුණු වැනි වැදගත් නොවන ශේෂ දෑ සහ ඒ සමාන වනත් දෑ,

අදහස් වේ.

29. මෙම ප්‍රඥප්තිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

10 - 582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.